සකස් කළේ- ඒ.ජී.නිරංජලා රෝහිණී කුමාරි මිය,ර/කුරුවිට ම.ම.වි.

නිපුණතා මට්ටම : 5.7 ජාතික ගිණුම්කරණයේ වැදගත්කම හා ජාතික ගිණුම්කරණයේ සීමා විග්‍රහ කිරීම.

**ජාතික ගිණුම් දත්තවල ප්‍රධාන භාවිතයන්**

i. ආර්ථිකයේ කාර්යසාධනය ඇගයීමට යොදා ගැනීම.
ii. ආර්ථික වෘද්ධිය මැනීම.
iii. ඒක පුද්ගල ජාතික නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීම.
iv. ආර්ථිකයේ ව්‍යුහමය ලක්ෂණ අනාවරණය කර ගතහැකි වීම.
v. කාර්යාත්මක ආදායම් ව්‍යාප්තිය අනාවරණය වීම.
vi. අන්තර්ජාතික සංසන්දනයන් සඳහා භාවිතා කළ හැකි වීම.
vii. ආර්ථික කාරක අතර ශ්‍රිතාත්මක සම්බන්ධතා හඳුනාගත හැකිවීම.
viii. සම්පත් සංයුතිය හා උපයෝජනය අනාවරණය වීම.
ix. ආර්ථික කළමනාකරණය සඳහා තොරතුරු ලබාගත හැකි වීම.
x. සාර්ව ආර්ථික විචල්යයන්ගේ හැසිරීම පුරෝකථනය කළ හැකි වීම.

**ජාතික ගිණුම් දත්තයන් පිළියෙල කිරීමේදී පවතින සීමා**

i. ගෘහණියන්ගේ සේවය ජාතික ගිණුම්වලට ඇතුළත් නොවීම.
ii. නීති විරෝධී ආර්ථික කටයුතු ජාතික ගිණුම්වලට ඇතුළත් නොවීම.
iii. නොවිධිමත් ආර්ථික කටයුතු ජාතික ගිණුම්වලට ඇතුළත් නොවීම.
iv. රාජ්‍ය සේවාවල ඵලදායීතාවයේ ඇති වන වෙනස්වීම් සැලකිල්ලට නොගැනීම.
v. නිෂ්පාදන හේතුවෙන් පරිසරයට වන බලපෑම් සැලකිල්ලට නොගැනීම.
vi. රාජ්‍ය ණය පොලී ගෙවීම ජාතික ගිණුම්වලට ඇතුළත් නොවීම.
vii. විවේක කාලය ජාතික ගිණුම්වලට ඇතුළත් නොවීම.
viii. කල් පවත්නා ඇතැම් පාරිභෝජන භාණ්ඩ ආයෝජන ලෙස සලකා ජාතික ගිණුම්වලට ඇතුළත් නොකිරීම.

<u>අභ්‍යාස</u>

1. හරිත දළ දේශීය නිෂ්පාදිතය යනු කුමක්ද?උදාහරණ දක්වන්න.
2. එය ගණනය කරන්නේ කෙසේද?